**මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2017**

**------------------------------------------------------------------------**

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එවකට ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව (ජාසජබැ) වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 99 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් පුනරුත්ථාපනය කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහල නැංවීම ඇතුළු මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් නිර්මාණය කිරීමෙන් වඩා හොඳ සනීපාරක්ෂක පහසුකම් මගින් මහවැලි ගඟේ ජලයේ ගුණත්වය හා ජීවන පරිසරය උසස් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණ අතර ඉතිරි මුදල වූ රු.මිලියන 4,060 කට සමාන ජපන් යෙන් මිලියන 3,191 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

කෙසේ වුවද 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ)	සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ)	විශේෂ (යෙන්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂය එම ගිණුමෙන් ආපසු ගැනීමේ හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල, සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව

(ඈ)	ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ)	මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ)	ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත් ය.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**-----------------------------------------**

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 පරිදි ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2018 මාර්තු 31 දින හෝ ඊට පෙර ලබා දිය යුතු වුවත් විගණනය වෙත ලබා දී තිබුණේ 2018 සැප්තැම්බර් 10 දිනදීය.

**2.2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

**--------------------------------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ජේදය ප්‍රකාරව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අත්සන් කළ යුතුය. කෙසේ වුවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් අදාල කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**----------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**

**-----------------------**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| අරමුදල් ප්‍රභවය | මූල්‍යායනය කිරීම සඳහා ණය ගිවිසුමේ එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන. | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජජාසනි | 14,087 | 17,922 | 3,000 | 1,298.89 | 1,702.14 | 3,414.52 | 4,483.52 |
| ශ්‍රීලංර | 3,191 | 4,060 | 147 | - | 82.45 | - | 475.72 |
| | 17,278 | 21,982 | 3,147 | 1,298.89 | 1,784.59 | 3,414.52 | 4,959.24 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ සම්පූර්ණ කාලය ආවරණය වන පරිදි ව්‍යාපෘතියේ අරමුණු ළඟාකරගැනීම සහතික කරනු වස්, වෙන්කළ සම්පත් උපයෝගී කරගෙන නියමිත කාලසීමාව තුළ මූල්‍ය හා භෞතික ඉලක්ක කැපීපෙනෙන ලෙස විස්තීර්ණ සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී වසර 07 යි මාස 10 ක් ගතවීමෙන් පසුව 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් වූ මුළු ණය වටිනාකමෙන් සියයට 25 ක් නියෝජනය වන රු.මිලියන 4,483.52 කට සමාන ජපන් යෙන් මිලියන 3,414.52 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ඊට අමතරව, 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද මුළු වෙන් කිරීම් වූ වටිනාකම රු.මිලියන 3,000 ක් අතුරින්, සියයට 56 කට සමාන රු.මිලියන 1,702.14 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි.

(ආ) ණය ගිවිසුමේ උපලේඛන 01 හි දක්වා ඇති පරිදි ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වාර්ෂික අරමුදල් අවශ්‍යතාවය අනුව 2017 දෙසැම්බර් 31 දින වන විට මුළු ණය වටිනාකම වූ ජපන් යෙන් 14,087 උපයෝජනය කිරීමට සැලසුම් කර තිබුණි. එම නිසා ණය නියෝජිතායතනය විසින් උපයෝජනය නොකල ණය ශේෂයට එරෙහිව බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 124.82 ක් 2017 දෙසැම්බර් 31 දින දක්වා අය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තා අනුව, ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,077 කට සමාන ජපන් යෙන් රු.මිලියන 12,034 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ව්‍යාපෘතියේ සිවිල් ඉදි කිරීම් වැඩ නුවර නගරයේ අප ජල පිරිපහදු පිරියතය ඉදි කිරීම, ප්‍රධාන අපජල වහන කාණුව, දේපල සබඳතා පරීක්ෂා වැඩි දියුණු කිරීම, සනීපාරක්ෂක පහසුකම වැඩි දියුණු කිරීම් වලට අදාල ඉදි කිරීම

නමින් වූ ප්‍රධාන පැකේජ 04 ක් යටතේ බෙදා තිබූ අතර කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාද වීම, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය, සහ ව්‍යාපෘතිය විසින් යොදා ගෙන තිබූ ප්‍රමාණවත් නොවූ නියාමන ක්‍රමවේද නිසා අදාල පැකේජවල භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසානයේ සියයට 44 සිට සියයට 96 දක්වා පරාසයක දැක්වුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආරම්භ කිරීමට සැලසුම් කළ දිනයට වඩා වර්ෂ 3 ½ ට පසු 2015 ජනවාරි ආරම්භ කරන ලද අප ජලය පිලියම් කිරීමේ පිරියත, ප්‍රධාන පොම්පාගාර මධ්‍යස්ථානය, පිරිපහදු කළ අපවහන බැහැර කිරීමේ පද්ධතිය, මඩ වියලි තටාංගනය සැලසුම් කිරීම හා ඉදිකිරීම කොන්ත්‍රාත්තුව සහ මෙහෙයුම් නඩත්තු උපකරණ සැපයීමේ කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 31 දිනට සියයට 44 ක් වැනි මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී.

(ආ) 2011 ජූලි ආරම්භ කිරීමට සැලසුම් කරන ලද ප්‍රධාන අපජල වහන කානුව (Trunk sewers), ශාඛා අපජල වහන කානුව (Branch sewers) සහ මනුබිල පොම්ප කිරීමේ මධ්‍යස්ථාන සැලසුම් කිරීමේ හා ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් මස ප්‍රදානය කර තිබුණි. තවද, 2018 ජූනි 30 දින වන විට ප්‍රධාන අපජල වහන බට එලීම් යටතේ වූ කාර්යන්ගෙන් මීටර 2,396 ක් සම්පූර්ණ කර තිබුණද එම දිනයට සම්පූර්ණ කළ යුතු ඇස්තමේන්තු ගත නල එලීමේ දුර මීටර 9,105 ක් විය. එයට අතිරේකව 2018 ජූනි 30 දිනවන විට මනුබිල පොම්ප කිරීමේ මධ්‍යස්ථාන 09 ක් සම්පූර්ණ කළ යුතු වුවද මනුබිල පොම්ප කිරීමේ මධ්‍යස්ථාන 02 ක පමණක් ඉදි කිරීම් වැඩ සම්පූර්ණ කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති ලේඛන අනුව දේපල සම්බන්ධතා සැලසුම් කිරීම හා ඉදි කිරීමේ පැකේජය යටතේ වූ කාර්යයන් 2017 වන විට අවසාන කිරීමට බලාපොරොත්තු වුවද ආරම්භ කර තිබුණේ 2016 ජූලි වලය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කාර්යයන් නිම කල යුතු දිනය වූ 2017 සැප්තැම්බර් 30 දිනය නොසලකා අදාල කොන්ත්‍රාත්තුවේ කාර්යය 2021 වන විට කිරීමට එකඟ වී තිබුණි.

### 3.4 පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දුන් නොවිසුඳුණ ගැටළු

-----------------------------------------------------------------

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වගන්තිය අනුව රු.මිලියන 5 හෝ ඊට වඩා වටිනාකම වූ කොන්ත්‍රාත් භාර ගන්නා කොන්ත්රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතු අතර කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු දින 60ක් තුල කොන්ත්‍රාත් ගිවිසුම් පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචි කල යුතු වේ. කෙසේ වුවද ව්‍යාපෘතිය සමඟ ගිවිසුම්වලට එළඹී කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකු ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවූ බව නිරීක්ෂණය විය.

### 3.5 මූල්‍ය පාලනයේ දුර්වලතා

----------------------------

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.

## 3.6 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධ ගැටළු

-----------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 සැප්තැම්බර් මස සිට ව්‍යාපෘතියේ සේවයේ නියුතු ප්‍රසම්පාදන විශේෂඥයා 2016 අගෝස්තු මස සිට ව්‍යාපෘතියේ සේවයෙන් ඉවත් වී ව්‍යාපෘතියේ සිවිල් ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත්කරුගේ සේවක මණ්ඩලයට කොන්ත්‍රාත් කළමණාකරු ලෙස 2016 සැප්තැම්බර් ලෙස සම්බන්ධ වී 2017 දෙසැම්බර් 31 දින දක්වා සේවය සපයමින් සිටි බව නිරීක්ෂණය විය.

(ආ) එස් එල්-පී 90 දරන ණය ගිවිසුම යටතේ මීට පෙර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් වූ 2011 මහනුවර අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සැලසුම් වැඩ සම්බන්ධ උපදේශක මෙම ව්‍යාපෘතියේද උපදේශක ලෙස සේවය කරයි. මෙම කොන්ත්‍රාත්තුව සැලසුම් කිරීම් හා ඉදි කිරීම් පදනම මත ප්‍රදානය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අදාල උපදේශකට පෙර ව්‍යාපෘතිය යටතේ ඔහු විසින් රු.මිලියන 368.12 ක පිරිවැයකට සැලසුම් කරන ලද කාර්යය නැවත පරීක්ෂා කර වෙනස් කිරීමට ඉඩ ප්‍රස්ථා තිබුණි.

(ඇ) ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ඥාතීන් දෙදෙනෙක් ප්‍රමාණ සමීක්ෂක හා සිවිල් ඉංජිනේරු ලෙස, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් 2 ක් යටතේ ඉදි කිරීම් වැඩ සම්බන්ධයෙන් සේවයේ නියුක්තව සිටි බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීම් අනුව ව්‍යාපෘතියේ කටයුතු කෙරෙහි ඔවුන්ගෙන් බලපෑමක් නොවන බැවින් මූල්‍ය ප්‍රකාශනවල එම කරුණ හෙළි දරව් කර නොතිබුණි.

## 3.7 මානව සම්පත් කළමණාකරණය

-----------------------------------

ව්‍යාපෘති සම්බන්ධීකරණ නිළධාරී යන තනතුරු අනුමත තනතුරු තුළ ඇතුලත්ව නොතිබුනද ව්‍යාපෘතිය විසින් එම තනතුරට පුද්ගලයෙක් බඳවා ගෙන තිබූ අතර පාරිශ්‍රමික ලෙස එකතුව රු.මිලියන 1.33 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි.